සැ. යු. - 2018.12.21 දින පළ වූ අංක 2,103 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,104 - 2018 දෙසැම්බර් මස 28 වැනි සිකුරාදා - 2018.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 876 |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 ජනවාරි මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජනවාරි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

## සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද (වාණිජ) මහාධිකරණයේ දී ය

පී ඇන්ඩ් සී ප්‍රොජෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, (FC1345) (අංක 30, කේ එස් එස් පාර, (යාපනය) යන සමාගම සම්බන්ධ කාරණාවක දී ය.

ඉන්දියාව, 638011, එරෝඩ්, පෙරුදුරෙයි පාර, දෙවන මහළ, පී ඇන්ඩ් සී ටවර්ස් හි පිහිටි පී ඇන්ඩ් සී ප්‍රොජෙක්ට්ස් (පී) ලිමිටඩ් සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ XVIII පරිච්ඡේදය යටතේ විදේශීය සමාගමක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබ ඇති

නඩු අංකය : CHC/91/18/CO.
ස්වභාවය : ඈවර කිරීම
කාර්යපටිපාටිය : ලඝු
වටිනාකම : රු. 8,000,000

2007 අංක 07 දරන සමාගම් පනතේ XII පරිච්ඡේදය යටතේ අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා කරනු ලබන අයදුම්පත සම්බන්ධයෙන් වූ කාරණාව සම්බන්ධයෙනි.

කැප්ටන් ස්ටීල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
කවුඩාන එස්ටේට්, උඩමාපිටිගම,
මල්වාන.

.........................................*පෙත්සම්කරු.*

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද (වාණිජ) මහාධිකරණය වෙත ඉහත නම් සඳහන් පී ඇන්ඩ් සී ප්‍රොජෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් වර්ෂ 2018 ක් වූ දෙසැම්බර් මස 04 වැනි දින ඉදිරිපත් කරන ලදුව වර්ෂ 2018 දෙසැම්බර් මස 13 වැනි දින ඉහත පෙත්සම්කරු වෙනුවෙන් කරුණු තහවුරු කරන ලදුව වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 28 වැනි දිනට පුවත්පත් දැන්වීම් ඉදිරිපත් කරනු ලැබීමට අධිකරණය විසින් නියම කර ඇති බව ද, විමසීම සඳහා වර්ෂ 2019 ක් වූ පෙබරවාරි මස 12 වැනි දිනට ද, දින නියම කර ඇති බවට ද, එකී පෙත්සම පිළිබඳ නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ පී ඇන්ඩ් සී ප්‍රොජෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයෙකු වේ නම් ඒ තත්කාර්ය සඳහා එකී විභාග කරන අවස්ථාවේදී තමාම හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටීමට හා පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී පී ඇන්ඩ් සී ප්‍රොජෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ඕනෑම සහදායකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තු ගෙවූ අය සඳහා මා විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

නීතිඥ එරන්ද එස්. වනසිංහ මහතා,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 42/2, චැපල් පටුමග,
නුගේගොඩ.

දුරකථනය : 0711-398420
071-5677329

පෙත්සම විභාග කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ එරන්ද එස් වනසිංහ මහතා වෙත භාරදිය යුතුය. නැතහොත් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් සඳහන්කළ යුතු අතර එය එම තැනැත්තා හෝ ව්‍යාපාරය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම අඩුම තරමින් වර්ෂ 2019 ජනවාරි මස 25 වැනි දින සවස. 6.00 පෙර ලැබෙන ලෙස භාර දිය යුතුය. තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබීමට කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

12-951

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.